

# ගොවිකටයුතු පුවත් හසුන

42 වන වෙළුම | සිවුවන කලාපය 2018 | ISSN - 1991 - 040X

## වනසතුන්ගෙන් සිදුවන වගා හානි කළමනාකරණය



## ආහාර සුරක්ෂිතතාවය සඳහා පාරම්පරික දැනුම







කෘෂිකර්ම අමාත්‍යාංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

# වනසතුන්ගෙන් වන වගා හානි කළමනාකරණය කර ගැනීම ගොවිතැනට ඇති ප්‍රධාන අභියෝගයක්

## කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර



ගොවීන් මුහුණ දෙන ගැටලු අතරින් සමහර ප්‍රදේශවල ගොවීන්ට ඇති ප්‍රධාන ගැටලුව වන්නේ සතුන්ගෙන් සිදුවන හානි බව කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා සඳහන් කළේය.

ඇමැතිතුමා මෙම කරුණු අනාවරණය කළේ ඔක්තොම්බර් මස 10 වන දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පැවති 'වන සතුන්ගෙන් සිදුවන වගා හානි කළමනාකරණය කිරීම සඳහා තිරසර විසඳුම් හඳුනා ගැනීම පිණිස වූ එක් දින වැඩමුළුව' අමතමිනි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කෘෂි සම්පත් කළමනාකරණ අංශය විසින් මෙම වැඩමුළුව සංවිධානය කරන ලදි.

ආහාර නිෂ්පාදනයෙන් 30% - 35% ත් අතර ප්‍රමාණයක් විනාශ වනුයේ සත්ත්ව හානිවලින් බව ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය කරන පර්යේෂකයින් උපුටා දක්වමින් ඇමැතිතුමා වැඩි දුරටත් සඳහන් කළේය. ගොවියාට නිසි මිලක් නොලැබීම සහ පසු අස්වනු හානි යන ගැටලු සඳහා ආමන්ත්‍රණය කර තිබුණද වන සත්ත්ව මෙතෙක් සැඟීමට පත් විය හැකි ප්‍රතිඵලදායක විසඳුමකට එළඹීමට නොහැකි වූ බව ඇමැතිතුමා පැවසීය. වන සත්ත්ව හානිය පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස පෙළ ගැසීම මේ මොහොතේ ඉතාමත් කාලෝචිත බව කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා සඳහන් කළේය.

බෝග වගාවේ අස්වනු හානිය ගොවි ජනතාවගේ ආර්ථික පාඩුව සහ ජීවිත අවදානම සඳහා හේතු වී ඇති වන සත්ත්ව ගැටුම කළමනාකරණය කිරීම සඳහා කෘෂිකාර්මික අංශයේ ආයතනවලින් ඉදිරිපත් වී ඇති යෝජනා පිළිබඳව බහුපාර්ශවීය අදහස් විමසීම, යෝජනා සම්බන්ධයෙන් ඇති සුදුසු ප්‍රතිශෝධන සහ විසඳුම් සංකලනය කොට මිනිස් වනසත්ත්ව ගැටුම කළමනාකරණය සඳහා බහුපාර්ශවීය

**ආහාර නිෂ්පාදනයෙන් 30% - 35% ත් අතර ප්‍රමාණයක් විනාශ වනුයේ සත්ත්ව හානිවලින් බව ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය කරන පර්යේෂකයින් උපුටා දක්වමින් ඇමැතිතුමා වැඩි දුරටත් සඳහන් කළේය**

එකඟතාවයක් සහිත විසඳුම් යෝජනාවලියක් සම්පාදනය කිරීම මෙම වැඩමුළුවේ අරමුණු විය.

කෘෂිකර්ම, ආර්ථික විද්‍යා, සත්ත්ව විද්‍යා, වන සංරක්ෂණ, ඉඩම්, සමාජ සුබ සාධන, රාජ්‍ය ප්‍රතිපත්ති යන අංශ නියෝජනය කරන විද්වතුන් සහ ආයතන නියෝජනය කරමින් 40 දෙනෙකුගෙන් යුත් විද්වත් කණ්ඩායමක් මෙම උපාය මාර්ගික යෝජනාවලිය කෙටුම්පත් කිරීම සඳහා දායකත්වය ලබා දුන්හ.

# පර්යේෂණ පුවත්

## ශ්‍රී ලංකාවේ ගිනිකොණදිග වියළි කලාපීය බඩඉරිඟු නිෂ්පාදන පද්ධතිය:

## තිරසරභාවය පිළිබඳ ගැටලු සහ වැඩි දියුණු කිරීමේ අවස්ථා

**බඩඉරිඟු** වාගව මෑත ඉතිහාසය තුළ සැලකිය යුතු පිබිදීමක් දැකිය හැකි වූ බෝග පද්ධතියකි. දේශගුණ විපර්යාස හමුවේ අභියෝගයට ලක්වන බඩඉරිඟු බෝග වගා පද්ධතියේ තිරසරභාවය, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන ප්‍රධාන සංරචක තුන මත පදනම්ව හඳුනාගැනීමට මෙම අධ්‍යයනයෙන් උත්සහ දරා ඇත.

බෝග වගාව පිළිබඳ වන සාම්ප්‍රදායික ආර්ථික දෘෂ්ටියට අමතරව එමගින් ජනිත කරන සමාජ සහ පාරිසරික බලපෑම මත පදනම් වෙමින් එය කෙතරම් දුරකට තිරසර වගා පද්ධතියක්ද යන්න හඳුනාගැනීමත් සමස්ත වගා පද්ධතියේම සංවර්ධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමත් මෙම අධ්‍යයනයේ අරමුණ වී තිබේ.

අධ්‍යයනයේ සොයාගැනීම්වලට අනුව බඩඉරිඟු වගාව අනෙක් වගාවන්ට සාපේක්ෂව ආර්ථික වශයෙන් ලාභදායි තත්ත්වයක පවතී. එනිසා ඒ වෙත ඉහළ තරුණ ආකර්ෂණයක් පැවතියද ගොවීන්ගෙන් 77%ක්ම වගා කටයුතුවල නිරත වනුයේ අනවසර බිම්වලය. වගාව සඳහා රසායනික පොහොර සහ වල්නාශක නිර්දේශිත මට්ටම්වලට වඩා වැඩි ප්‍රමාණවලින් භාවිතා වන අතර කෘමිනාශක භාවිතය අවම මට්ටමක පවතී.

පර්යේෂකයින් විසින් නිර්දේශ ඉදිරිපත් කරමින් සඳහන් කරනුයේ බඩඉරිඟු බෝග වගා පද්ධතිය තුළ පරිසර තිරසරභාවය තහවුරු කිරීමට ඉහළම අවධානයක් දිය යුතු බවයි. කෘෂිරසායන යෙදීමේ දී නිවැරදි ක්‍රමවේද භාවිතය කාර්යක්ෂම ලෙස පොහොර සහ වල්නාශක පරිහරණය වැඩි දියුණු කිරීම එහිදී ප්‍රධාන වේ. ආර්ථික තිරසරභාවය සහ සමාජීය තිරසරභාවය ඉහළ නැංවීමට අදාළ නිර්දේශ ද අධ්‍යයනය තුළින් ඉදිරිපත් කර ඇත.

භාණ්ඩාගාර අරමුදල සහ ගෝලීය විචලතා පර්යේෂණ පිළිබඳ ආසියානු-පැසිෆික් ජාලයේ අරමුදලින් අධ්‍යනය සිදු කෙරී ඇත. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එස්.ඇපාසිංහ මහතාගේ සම්බන්ධීකරණයෙන් හා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී සුසිලා ලූර්දු මහත්මියගේ හා පර්යේෂණ නිලධාරී අමල් දිසානායක මහතාගේ සම පර්යේෂකත්වයෙන් අධ්‍යයනය සිදු කෙරී ඇත.

**පර්යේෂකයින් විසින් නිර්දේශ ඉදිරිපත් කරමින් සඳහන් කරනුයේ බඩඉරිඟු බෝග වගා පද්ධතිය තුළ පරිසර තිරසරභාවය තහවුරු කිරීමට ඉහළම අවධානයක් දිය යුතු බවයි.**





# ශ්‍රී ලංකාවේ වී අලෙවිකරණයේදී පුද්ගලික හා රාජ්‍ය අංශයේ මැදිහත්වීම පිළිබඳව වී ගොවීන්ගේ වර්තමාන දැක්ම සහ අනාගත දිශානතිය පිළිබඳ ඇගයීම

**ගොවීන්** වී අලෙවි කිරීමේ තීරණ ගැනීම, ඔවුන් මුහුණ දෙන ගැටලු සහ ඔවුන් යෝජනා කරන වියදම් පිළිබඳව අධ්‍යයනය ඉදිරි සැලසුම්කරණයේදී බෙහෙවින් වැදගත් වේ.

ගොවීන් වී අලෙවි කිරීමේදී රාජ්‍ය හා පෞද්ගලික අංශය තෝරා ගැනීමට ඉවහල් වන සමාජ ආර්ථික කරුණු පිළිබඳව සොයා බැලීම සහ සමස්ත වී අලෙවි ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය නිර්දේශ ලබාදීම ප්‍රධාන අරමුණු වේ.

විශේෂිත අරමුණු අතර රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත වී ගොවීන් යොමු වීම සඳහා බලපාන ප්‍රධාන කරුණු අධ්‍යයනය කිරීම, විවිධ අලෙවි ක්‍රියාදාම තුළ ගොවීන් මුහුණු දෙන ගැටලු සහ යෝජනා හඳුනා ගැනීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වී අලෙවිකරණ ක්‍රියාවලීන් වඩාත් කාර්යක්ෂම කිරීමට අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගැනීමට අපේක්ෂා කරයි. මූලික ක්ෂේත්‍ර සමීක්ෂණය ප්‍රධාන වී නිෂ්පාදන දිස්ත්‍රික්ක 4ක් වන අම්පාර, අනුරාධපුරය, මඩකලපුව සහ පොලොන්නරුව යන ප්‍රදේශවල ගොවීන් 350ක් ආවරණය වන පරිදි නිමකර ඇති අතර දත්ත පරිගණක ගත කිරීම අවසන් කොට දත්ත විශ්ලේෂණය සිදු කරමින් පවතී.

අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශයෙන් සිදු කරනු ලබන අධ්‍යයනයේ සම්බන්ධීකරණ කටයුතු පර්යේෂණ නිලධාරී ඩබ්.ඒ.එන්.විජේසූරිය මහතා විසින් සිදු කරනු ලබන අතර සහය පර්යේෂණ නිලධාරීන් ලෙස කටයුතු කරනුයේ පී.ඒ.ජේ.චම්පිකා මෙනෙවිය සහ විරාජිත් කුරුප්පු යන මහත්වරුන්ය.

## තිරසර කෘෂිකර්මාන්තය: සංකල්පයක් ද ? යථාර්ථයක් ද ?

තිරසාර කෘෂිකර්මාන්තය : සංකල්පයක් ද යථාර්ථයක් ද යන මැයින් වෙස්ටන් සිඩ්නි විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ප්‍රීති ක්‍රිෂ්ණා මහත්මිය විසින් ආයතනයේ පර්යේෂණ නිලධාරීන් උදෙසා දේශනයක් පවත් වන ලදි.

2018 දෙසැම්බර් 05 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මහින්ද සිල්වා ශ්‍රවණාගාරයේ දී එය පැවැත්විණි.



# මිනිස් ක්‍රියාකාරකම් නිසා ග්‍රාමීය වැව් ගොඩවීමට ලක්වීම කෘෂිකර්මාන්තය කෙරෙහි බලපෑම පිළිබඳ පිළිබඳ අධ්‍යයනය

වියළි කලාපයේ කුඩා ජලාශ ගොඩවීමට ලක්වී ඇති ප්‍රමාණය සහ එම ප්‍රදේශවල ගොවීන්ගේ ජීවනෝපායයන්ට එයින් සිදු වී ඇති බලපෑම අධ්‍යයනය කිරීමට මෙම අධ්‍යයනය මඟින් අපේක්ෂා කරයි. ජලාශ සංරක්ෂණ ප්‍රදේශ අත්පත් කර ගැනීමේ මට්ටම සහ අත්පත් කර ගැනීමේ ක්‍රම හඳුනා ගැනීමට, කුඩා ජලාශවල ජලාධාර සහ සංරක්ෂිත ප්‍රදේශ අත්පත් කර ගැනීමේ තීව්‍රතාව ගණනය කිරීම, කාලයක් ගත වන විට ජලාශවල ජල ධාරිතාව අඩු වීම හා රොන් මඩ තැන්පත්වීමට හේතු සහ අනුපාතය තක්සේරු කිරීම හා හඳුනා ගැනීම වැනි විශේෂිත අරමුණු කිහිපයක් ද ඒ සමග සැලකිල්ලට ගෙන තිබේ.

අධ්‍යයනයේ සොයා ගැනීම් අතර ඒක පුද්ගල බිම් ප්‍රමාණය ඉතා අඩු වීම, ගමෙහි ජලාධාර ප්‍රදේශය ක්‍රමයෙන් හීන වී යාම, වගා කළ හැකි ප්‍රදේශයට වාරි ජලය සැපයිය හැකි පරිමාව අඩු වීම වැනි කරුණු පෙන්වා දෙයි.

ඒ සඳහා නිර්දේශ ලෙස වැසි ජලය භාවිතයෙන් වගා කටයුතු සිදු කිරීමටත්, ප්‍රතිසංස්කරණය පිණිස ජලාශ තෝරා ගැනීමේ දී යෝග්‍ය නිර්ණායක නිර්මාණය කිරීම,ජලාශ ප්‍රතිසංස්කරණය කිරීම, පසු විපරම් කටයුතු සඳහා භෞතික හා මූල්‍ය පහසුකම් සැපයීම, ගොවි සංවිධාන ශක්තිමත් කිරීම පිණිස ශක්‍යතා වර්ධනය කිරීම මෙන්ම දේශගුණයට සුහුරු කෘෂිකර්මාන්තය හා බෝග විවිධාංගීකරණය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම යන නිර්දේශයන් මෙම අධ්‍යයනය මඟින් ඉදිරිපත් කරයි.

මෙම අධ්‍යයනයේ ප්‍රාථමික දත්ත කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි ග්‍රාම නිලධාරී කොට්ඨාස 11ක් පුරා ඇති ගොවි සංවිධාන 7ක් නියෝජනය කරමින් එක්රැස් කර ඇත. පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්.එච්.ඒ ශාන්ත මහතා විසින් අධ්‍යයනයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇති අතර ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී ජී.ජී.ද.එල්.ඩබ්ලිව් සමරසිංහ මිය, කේ.ඒ.බී.එස් රූපසිංහ, ප්‍රභාත් විතාරන, බී.ඒ.ජී අලුත්ගම යන පර්යේෂණ නිලධාරීන් සමපර්යේෂකවරුන් ලෙස කටයුතු කරති.

"අධ්‍යයනයේ සොයා ගැනීම් අතර ඒක පුද්ගල බිම් ප්‍රමාණය ඉතා අඩු වීම, ගමෙහි ජලාධාර ප්‍රදේශය ක්‍රමයෙන් හීන වී යාම, වගා කළ හැකි ප්‍රදේශයට වාරි ජලය සැපයිය හැකි පරිමාව අඩු වීම වැනි කරුණු පෙන්වා දෙයි"





# ආහාර සුරක්ෂිතතාවය සඳහා පාරම්පරික දැනුමෙහි වැදගත්කම

**පාරම්පරික** දැනුම යනු කෘෂිකාර්මික නිෂ්පාදනය පිරිවැය සූක්ෂම සහ තිරසාර අන්දමින් සිදු කිරීමටයොදා ගත හැකි වටිනා ජාතික සම්පතකි. එබැවින් විද්‍යා හා තාක්ෂණික ක්‍රමවේද තුළින් මෙන්ම පාරම්පරික දැනුම භාවිතය ද සංකලනය වූ ප්‍රවේශයක් භාවිතා කිරීම මගින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය තිරසාර සංවර්ධනයක් කරා ගමන් කිරීමට හැකිවනු ඇත.

2016-2018 ජාතික ආහාර වැඩසටහන තුළින් ද වත්මන් රජය අපේක්ෂා කරනුයේ නූතන කෘෂිකර්මාන්තය තුළ සම්ප්‍රදායික දැනුම සහ භාවිතාවන් ප්‍රයෝජනයට ගැනීමටයි. එබැවින් ගොවීන් අතර ශේෂව පවත්නා පාරම්පරික දැනුම සොයා බැලීම, එම භාවිතාවන් කෙතරම් දුරට ප්‍රයෝජනයට ගෙන තිබේද, ඒවායෙහි ආර්ථික වටිනාකම කෙබඳුද යන්න සොයා බැලීම ඉතා වැදගත්ය.

### මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේ,

- බෝග වගා කිරීමේ දී දැනට පවතින පාරම්පරික දැනුම හඳුනා ගැනීම
- පාරම්පරික දැනුම භාවිතා කිරීමේ දී පවතින බාධා සහ ගැටලු හඳුනා ගැනීම
- බෝග වගාවට අදාළව පාරම්පරික දැනුම භාවිතා කිරීමේ බලපෑම තක්සේරු කිරීම
- බෝග වගා කිරීමේ දී පාරම්පරික දැනුම භාවිතා කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය නිර්දේශ සැපයීම

මෙම අධ්‍යයනයට අදාළව දිස්ත්‍රික්ක 13ක් නියෝජනය වන පරිදි දත්ත එක්රැස් කිරීම දැනට සිදු කර තිබේ. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආර්.එල්.එන් ජයතිස්ස මහතාගේ සම්බන්ධීකරණයෙන් සිදු කරන මෙම පර්යේෂණ සම පර්යේෂකයින් ලෙසින් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනියන් වන සුසිලා ලූර්දු , සාගරිකා හිටිහාමු ද පර්යේෂණ නිලධාරීන් වන අමල් දිසානායක, දිලිනි පෙරේරා ද කටයුතු කරති.





# විද්‍යා - තාක්ෂණ හා අධ්‍යාපනික ප්‍රදර්ශනය

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 74 වැනි සැසිවාරයට සමගාමීව සංවිධානය කළ විද්‍යාතාක්ෂණ හා අධ්‍යාපනික ප්‍රදර්ශනය දෙසැම්බර් 5,6,7 සහ 8 දිනයන්හි කොළඹ විශ්වවිද්‍යාලීය විද්‍යාපීඨ පරිශ්‍රයේදී හා එහි පරිගණක පාසල් පරිශ්‍රයේදී පැවැත්විණි.

වර්ෂ 1944 දී ආරම්භ වූ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය ශ්‍රී ලාංකිකයින්ගේ විද්‍යා දැනුම ප්‍රවර්ධනය පෙරදැරි කොටගෙන ක්‍රියාත්මක වන ආයතනයක් වන අතර රටේ සංවර්ධනයට හේතුවන විද්‍යා හා තාක්ෂණික දැනුම රටට බෙදාදීමේ මුඛ්‍ය පරමාර්ථය ඇතිව වැඩසටහන් ක්‍රියාවට නංවනු ලබයි.

ශ්‍රී ලංකාවට නිදහස ලැබී ගත වූ වසර 70 තුළ අප ලබා ඇති විද්‍යා හා තාක්ෂණ දියුණුව විදහා දැක්වූ මෙම ප්‍රදර්ශනයට හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ද ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කර තිබුණි. ප්‍රදර්ශනයට පාසල් සිසුන් සහ මහජනතාව විශාල පිරිසක් සහභාගී වූහ.



# නව කෘෂි සංස්කෘතියක් උදෙසා HARVEST -2018

නව කෘෂි සංස්කෘතියක් බිහි කිරීමේ අරමුණින් කෘෂිකර්ම අමාත්‍යාංශය සංවිධානය කළ HARVEST -2018' නවීන කෘෂිකාර්මික ප්‍රදර්ශනය දෙසැම්බර් මස 11- 16 දින දක්වා කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පැවැත්විණි.

ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රය නවීකරණයෙහි ලා වැඩි ඵලදායී ඇති නවීන කෘෂිකාර්මික තාක්ෂණික නවෝත්පාදන විදහා පෑම ඇතුළු අරමුණු රැසක් පාදක කරගෙන එය සංවිධානය කර තිබුණි.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කෙරුණු ප්‍රදර්ශනයෙහි තේමාව ' ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය නවීකරණය කිරීමයි. ප්‍රදර්ශනය පැවති දින කිහිපය තුළ පෙ.ව 9 සිට රාත්‍රී 9 දක්වා සියලුම ප්‍රදර්ශන කුටි මහජනතාව වෙනුවෙන් විවෘත වී තිබුණි.

හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ද ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කර තිබූ අතර අප ආයතනයේ පර්යේෂණ වාර්තා එහි අලෙවි කෙරිණි.



# වාර්ෂික විනෝද චාරිකාව

සහෝදර සේවක මණ්ඩලය අතර සුහදතාව වර්ධනය කිරීමේ අරමුණින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සුබ සාධක සංගමය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලැබූ විනෝද චාරිකාව 2018.11.06 දිනට යෙදී තිබුණි.

දකුණු පළාතේ සුන්දර සංචාරක පාරාදීසයක් වන මාදු ගඟ, කැස්බෑවුන් සංරක්ෂණ මධ්‍යස්ථානය, අලුත්ගම කන්දේ විහාරය හා ඒ ආශ්‍රිත ආකර්ෂණීය ස්ථාන රැසක් දැකබලා ගැනීම සඳහා චාරිකාව තුළ පිරිසට අවස්ථාව උදා විණි.

වාර්ෂික චාරිකාව සඳහා සාමාජිකයින් රැසක් සහභාගී වූ අතර අප ආයතනයේ අධ්‍යක්ෂ කරුණාදාස උඩගේ මහතා ද සහෝදර සේවක මණ්ඩලය සමඟ මෙම සුහද මොහොතට එක්විය.



## ගොවි කටයුතු පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ආයතනය සහ ගොවි කටයුතු ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් සංවිධාන මඟින් සිදු කෙරෙන පර්යේෂණ හා ක්‍රියාකාරී වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙ මඟින් ප්‍රකාශයට පත් කෙරේ.

ලබාගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකි ය.

### උපදේශකත්වය

කීර්ති බී. කොටගම

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී

### අධීක්ෂණය

එස්.ඒ.සී.යූ. සේනානායක

ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී

### සම්පාදනය

වසන්ති රාජපක්ෂ

ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී

### නිර්මාණකරණය

උදේනි කරුණාරත්න

ගොවිකටයුතු පුවත් හසුන ප්‍රකාශනය, මුද්‍රණය සහ බෙදාහැරීම

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**
අංක 114, විජේරාම මාවත කොළඹ 07
දුරකථනය - 0112 696981, ෆැක්ස් - 0112 692423
වෙබ් අඩවිය : www.harti.gov.lk